# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2125/14 - 2019 මැයි මස 28 වැනි අඟහරුවාදා - 2019.05.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ගැසට් නිවේදනය සංශෝධනය

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන 27 වන හා 33 වගන්ති යටතේ විෂය භාර අමාත්‍යවරයා විසින් අංක 1113/12 සහ 2000 ජනවාරි 04 වැනි අඟහරුවාදා දින නිකුත් කරන ලද ගැසට් පත්‍රිකාවේ නියෝග යටතේ වූ 1 කොටසට අයත් වූ 3 - අර්ථ නිරූපන ඡේදයේ 03 : 07 පුහුණු පරිවේණාචාර්ය යනුවෙන් අදහස් කරන්නේ යන්නට සංශෝධනයක් ලෙස මෙහි පහත දැක්වෙන (ඇ) ලෙස දැක්වෙන වගන්තිය ඇතුළත් විය යුතු ය.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය.

2018 ඔක්තෝබර් මස 14 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
ඉසුරුපායේ - ගොඩනැගිල්ලේ පිහිටි අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ඇ) 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 13 (ඇ) වගන්තිය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව පිහිටුවා ඇති වේනමුල්ල පිරිවෙන් අභ්‍යාස ආයතනයේ තෙවසරකට නොඅඩු පුහුණුවකින් පසු විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වන අවසන් පරීක්ෂණයෙන් ලබන සාමාර්ථය පරිවේණාචාර්ය සේවයේ 3 වන පංතියේ 1 ශ්‍රේණියේ පරිවේණාචාර්ය වරයෙකු ලෙස පත් කිරීමට සුදුසුකමක් වන්නේ ය.

06 - 237